වීසා

එක්සත් ජනපද සංක්‍රමණික නීතිය අනුව ඔබ ලබා ගත යුතු වීසා වර්ගය නිර්ණය කරන්නේ ඔබේ සංචාරයේ අරමුණ හා අනිකුත් කරුණු අනුව වේ. වීසා අයදුම්කරුවෙක් ලෙස ඔබ අයැදුම් කරන වීසා වර්ගය ලබා ගැනීමට තිබිය යුතු සියලු ම අවශ්‍යතා ඔබ සපුරා ඇති බව තහවුරු කළ යුතු වේ.

එක්සත් ජනපදයට සංචාරය කිරීමේ ඔබේ අරමුණ අනුව ඔබට අදාළ වන්නේ කුමන වීසා වර්ගය දැයි දැන ගැනීමට usvisas.state.gov වෙබ් අඩවියේ Directory of Visa Categories බලන්න.

**සංක්‍රමණ නොවන වීසා**
**සංක්‍රමණ වීසා**

වීසාවක් යනු කුමක් ද?

එක්සත් ජනපදයට ඇතුළු වීමට අපේක්ෂා කරන විදේශ රටක පුරවැසියෙක් සාමාන්‍යයෙන් එක්සත් ජනපද වීසාවක් ලබා ගත යුතු අතර එය සංචාරකයාගේ පුරවැසිභාවය ඇති රටෙන් නිකුත් කරනු ලබන සංචාරක ලේඛනය වන සංචාරකයාගේ ගමන් බලපත්‍රයේ තබනු ඇත.

විසා රහිත සංචාරක අවශ්‍යතා සපුරා ලන සමහර ජාත්‍යන්තර සංචාරකයන්ට වීසාවක් නොමැතිව එක්සත් ජනපදයට ඇතුළු වීමට සුදුසුකම් තිබිය හැක. මෙම වෙබ් අඩවියේ වීසා කොටසේ එක්සත් ජනපදයට එන විදේශීය පුරවැසියන් සඳහා වූ එක්සත් ජනපද වීසා පිළිබඳ ව වේ.

(සටහන: එක්සත් ජනපද පුරවැසියන්ට සංචාර සඳහා එක්සත් ජනපද වීසාවක් අවශ්‍ය නොවන නමුත් ඔවුන් පිටරටකට යන විට යෑමට බලාපොරොත්තු වන රටේ තානාපති කාර්යාලයෙන් නිකුත් කරන වීසාවක් තිබීම අවශ්‍ය විය හැකියි.)

අප හා සම්බන්ධ වීම

පාරිභෝගික සේවා නියෝජිතයෙක් හා සම්බන්ධ වීමට GSS Contact Us පිටුවට පිවිසෙන්න. පූර්ණ තොරතුරු සඳහා පහත දැක්වෙන සබඳතා තොරතුරු භාවිතා කරන්න.

ඇමතුම් මධ්‍යස්ථාන දුරකථනය:

ශ්‍රී ලංකාවේ සිට ඇමතීමට 94-11-770=3703

එක්සත් ජනපදයේ සිට ඇමතීමට 1-703-988-3469

ඉ-තැපැල: support-srilanka@ustraveldocs.com

http://www.ustraveldocs.com/lk/lk-main-contactus.asp

පාරිභෝගික සේවා ප්‍රකාශනය

රාජ්‍ය දෙපාර්තමේන්තුව වීසා ක්‍රියාවලිය ඉතා විධිමත් ව නමුත් සාධාරණ ව ක්‍රියාත්මක කරන්නේ එක්සත් ජනපදය හොඳින් ම ආරක්ෂා වන ආකාරයටයි. හැම විටම එක්සත් ජනපදයේ ලක්ෂණයක් වූ විවෘත භාවයට ද අපි කැප වෙමු. එක්සත් ජනපදයට සංචාරය කිරීම දිරි ගන්වමින් අපි ඔබ සාදරයෙන් පිළිගනිමු.

වීසා අයදුම්කරුවෙක් වන ඔබට, අපි මෙසේ පොරොන්දු වෙමු.

- ඔබට වීසාවක් නිකුත් කිරීමට අපට නො හැකි වුවත් අපි ඔබට ගරු කටයුතු ලෙස සලකමු.
- ඔබ පුද්ගලයෙකු ලෙසත් ඔබේ කාර්යය සුවිශේෂී ලෙසත් අපි සලකමු.
- වීසා සම්මුඛ පරීක්ෂණය ඔබට අලුත් හා තැති ගන්වන සුළු අත්දැකීමක් විය හැකි බැවින් ඔබ චකිතයෙන් පසු විය හැකි බව අපි මතක තබා ගනිමු.
- සම්මුඛ පරීක්ෂණයට ඇති සීමිත කාලය, ඔබේ සංචාරක සැලසුම් හා අරමුණු ගැන හැකි තාක් දුරට සම්පූර්ණ අදහසක් ලබා ගැනීමට අපි යොදා ගන්නෙමු.
- ව්‍යාපාරික, අධ්‍යාපනික හා අතිකුත් වැදගත් බැඳීම් අනුව අවශ්‍ය වන කාලය තුළ සංචාරය කිරීමට හැකි වන පරිදි දින වෙන් කරවා ගැනීමට සියලු ම අයදුම්කරුවන්ට සහාය වීමට ලබා ගත හැකි සියලු සම්පත් භාවිතයට ගනිමු.
- වීසා අවශ්‍යතා හා අයැදුම් කිරීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳ නිවැරදි හා විස්තරාත්මක තොරතුරු සෑම තානාපති හා කොන්සියුලර් වෙබ් අඩවියක ම පළ කරමු.
- සෑම තානාපති හා කොන්සියුලර් කාර්යාලයක ම සම්මුඛ පරීක්ෂණ සඳහා දින වෙන් කරවා ගැනීමේ පොරොන්තු කාල පිළිබඳ තොරතුරු http://travel.state.gov වෙබ් අඩවියේ පළ කරමු.
- වීසාවක් ලබා නො දුන්නේ නම් එයට හේතු අපි ඔබට පැහැදිලි කරමු.

  **තවද**
- ඔබ ශිෂ්‍යයෙක් නම් ඔබට සම්මුඛ පරීක්ෂණය සඳහා කලින් දිනයක් වෙන් කර දීමට සියලු උත්සාහයන් දරන අතර සුදුසුකම් ඇත්නම් පංති ආරම්භ වීමට පෙර වීසාවක් ලබා දීමට ද කටයුතු කරමු.
- ඔබ වෛද්‍ය හෝ මානුෂීය හදිසි කටයුත්තක් සඳහා සංචාරය කරන්නෙක් නම්, ජීවිතයට තර්ජනයක් විය හැකි හදිසි අවස්ථාවන් ට මුහුණ පා ඇති අයගේ වීසා සැකසුම් කාලය ඉක්මන් කිරීමට කටයුතු කරමු.
- ඔබ ව්‍යාපාරික සංචාරකයෙක් නම් ඔබේ ව්‍යාපාරික සංචාරය පහසු කිරීමේ සුදුසු යන්ත්‍රණයක් පිහිටුවීමටත් ඇමරිකානු ව්‍යාපාරවලට වැදගත් වන සංචාර ඉක්මන් කිරීමටත් කටයුතු කරමු.

ඒ සමගම වීසා අයදුම්කරුවෙක් ලෙස අප ඔබෙන් පහත සඳහන් දෑ අපේක්ෂා කරමු.

- හැකි තාක් කලින් ඔබේ සංචාරය සැලසුම් කර වීසා අයැදුම් පත ඉදිරිපත් කරන්න.
- ඔබේ අයදුම්පත සම්පූර්ණ ව හා නිවැරදිව සම්පූර්ණ කරන්න.
- ඔබේ අරමුණු හා සැලසුම් ගැන පැහැදිලි අදහසක් ඉදිරිපත් කරන්න.
- ඔබේ අරමුණු නිවැරදිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමට ඔබේ සම්මුඛ පරීක්ෂණයට සූදානම් වන්න.